// ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 60 — 1973 මැයි 18 වැනි සිකුරාද — 1973.05.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අනන් එක් එක් භාෂාවටම වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| පනත් ... — — | (අතිරේක) |
| ශ්‍රී ලංකා ඇපැල් මහාධිකරණයේ දැන්වීම — ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දැන්වීම ... | 83 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම — ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම — ... | — |
| පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම — ... | 83 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම ... — — | 85 |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම ... — — | — |
| නොතාරිස් ලැයිස්තුව ... — — | — |
| විවිධ දැන්වීම ... — — — | — |


## දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහල උසාවිවල දැන්වීම

**නඩු පොත් විනාශ කිරීම**

1967. 12.31 වැනි දිනට පෙරාතුව මෙම උසාවියේ පවරන ලද නඩුවල වාර්තා විනාශ කිරීමට අදහස් කර සිටිමි. එම කාලසීමාවට අදාල යම්කිසි නඩුවක් විනාශ නොකළ යුතු නම් එයට සම්බන්ධිත පුද්ගලයෙකු විසින් ඒ බව මෙම නිවේදනය පලවී මාස තුනක් ඇතුළත මා වෙත දන්විය යුතුය.

එම්. එච්. බී. මොරායස්,
කොළඹ නාගරික මහෙස්ත්‍රාත්.

1973 මැයි මස 08 වැනි දින,
කොළඹ, නාගරික මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

5–510—73.05.18 දින අංක 60 දරන ගැසට් පත්‍රය

## පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම

### මධ්‍යම පළාත

**කොළඹ දිස්ත්‍රික් උසාවියේ දීය**

සීමාසහිත කොළඹ ටයිම්ස් ඔෆ් සිලෝන් ...............පැමිණිලිකරු.
අංකය : 50329/එම් එදිරිව
ගම්පොල "දෙණිය වලව්වේ" එච්. ඩබ්ලිව්. කිරින්ද......විත්තිකරු.

මෙහි පහත සඳහන් වෙන දේපලවලින් ඉහතකී නඩුවේ විත්තිකරුට තිබෙන සියලුම අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයන් වර්ෂ 1973 ක් වූ ජූනි මස 20 දින පෙරවරු 11 පිහිටි ඉඩමේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. මෙම වෙන්දේසිය පවත්වනු ලබන්නේ, ඉහත කී නඩුවට අයත් රු. 10,263.39 ක් සහ පොලිය අයකර ගැනීම සඳහාය.

උපලේඛනය

1. මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ගඟ පහල කෝරළේ ගල්ගෙඩියාවේ කිරින්දේ පිහිටි ද්විරුබිත්තිය නොහොත් පන්සල වත්ත කියන අක්කර එකයි පර්චස් පහක් (අ. 1, රූ. 0, පර්. 5) විශාල ඉඩම වන ඊසානට: ගල්ගෙඩියාව ද, ගිනිකොණට: සයිමන් පෙරේරා ගේ ඉඩම ද, දකුණට: කුමාරිහාමිගේ ඉඩමද, වයඹට: සිංහපුලිගේ අප්පු සිංඤෝගේ ඉඩමද, යන මායිම් තුළ ඉඩම.

2. ඉහත කී ගල්ගෙඩිය ඔය, කිරින්දේ පිහිටි දිවිරුබිත්තියේ කියන අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහතුනක් (අ. 1, රූ. 2, ප. 13) විශාල උතුරට: ගල්ගෙඩි ඔයද, නැගෙනහිරට: සයිමන් පෙරේරාගේ ඉඩමේ එඩරු වැටද, දකුණට: උණම්බුවේ වලව්වේ ඉඩමද, බස්නාහිරට: ජුවානිස් සොයිසාගේ ඉඩමද මායිම් වූ ඉඩම්ද.

3. ඉහත කී ගල්ගෙඩි ඔය කිරින්දේ පිහිටි දිවිරුබිත්තියේ හේන (කොටසක් සහ පාරට පහතින් පිහිටා ඇත) කියන රූඩ් දෙකකුත් පර්චස් දහහතර හමාරක් (අ. 0, රූ. 2, පර්. 14½) මහතැති නැගෙනහිරට: පුවක්ගස සහ හපුපැලද, දකුණට: වලව්වේහේනේ ඉඩමද, බස්නාහිරට: මිල්ලගහ සහ උස්වෙදරාලගේ වත්තේ වැටද, උතුරට: ඔයද, යන මායිම් තුළ ඉඩමද.

4. ඉහත කී ගල්ගෙඩි ඔය කිරින්දේ පිහිටි ඇල්ලේගොඩ නොහොත් එඹම්පෙතේ හේන කියන අක්කර එකයි, රූඩ් තුනයි, පර්චස් තිස්හයයි (අ. 1, රූ. 3, පර්. 36) මහතැති, උතුරට: ඔයද, නැගෙනහිරට: මියම්බොක්කේ හේනද, දකුණට: අංගම්මන

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පලවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.**

**1972 ජනවාරි මස 7 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.**

**එල්. ඩබ්ලිව්. සී. සිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

### නයිසයි ආඥාවයි

### මාතර දිස්ත්‍රික් උසාවියේ දීය

අන්තිම කැමති පත්‍රයක් හා තෙස්තමේන්තුවක් තිබියදී නැසීගිය වැලිගම හෙට්ටිවීදියේ පදිංචිව සිටි සෝමි ගුණරත්න, විවාහයට පෙර අඹරසූරිය මහත්මියගේ බූදලය පිළිබඳ කාරණාව ගැනයි.

වැලිගම හෙට්ටිවීදියේ "සෝමි නිවසේ" පදිංචි ඇල්ප්‍රඩ් ගුණරත්න ............................................................. පෙත්සම්කරු.

බූදල් නඩු අංකය : ටී/5276 එදිරිව

කොළඹ මරදානේ පිහිටි මහාබෝධි සමාගම ......... වගඋත්තරකරු.

පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටින නීතිඥ සී. ඩී. සමරසේකර මහතා පෙනී සිටියදී වර්ෂ 1972ක් වූ ඔක්තෝබර් මස 18 වැනි දින මෙම කාරණය සුදුස්සක් කිරීම පිණිස මාතර දිස්ත්‍රික් විනිශ්චයකාර තැන්පත් ජේ. එෆ්. ඒ. සෝසා මැතිතුමා ඉදිරියට පමුණුවන ලදුව පෙත්සම්කරුගේ 1972 සැප්තැම්බර් මස 17 වැනි දින දරණ දිවුරුම් ප්‍රකාශයද, මහජන නොතාරිස් සී. ඩී. සමරසේකර මහතාගේ 1972 ඔක්තෝබර් 17 වන දින දිවුරුම් ප්‍රකාශයද, කැමිලස් කොටිකාවත්තගේ 1972 ඔක්තෝබර් මස 12 දින දරණ දිවුරුම් ප්‍රකාශයද, වැලිකැන්දෙ ගමගේ ඒබ්‍රහම්ගේ 1972 ඔක්තෝබර් මස 14 වන දින දරණ දිවුරුම් ප්‍රකාශයද කියවා බැලීමෙන් පසු,

ඉහත සඳහන් වගඋත්තරකරුගේ මෙම කාරණය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන වෙනත් කෙනෙකු විසින් හෝ මෙම අධිකරණය සෑහීමකට පත්වන අයුරු 1973.01.19 වැනි දිනට පෙර යම් විරුද්ධවාදී කාරණා නොපෙන්නුවහොත් දැනට මෙම අධිකරණයෙහි තැන්පත් කොට ඇති මහජන නොතාරිස් චාලි ඩයස් සමරසේකර මහතා විසින් 1970 මාර්තු මස 17 වැනි දින සහතික කරන ලද අංක 9638 දරණ නැසීගිය සෝමි ගුණරත්න "විවාහයට පෙර" අමරසූරිය මහත්මියගේ අන්තිම කැමති පත්‍රය ඔප්පු වූ බවද, ඔප්පු වූ බව මෙයින් ප්‍රකාශ කරන බවද, එකී අන්තිම කැමති පත්‍රයෙහි නම් කරන ලද බූදල් බලකරු එකී පෙත්සම්කරු වන ඇල්ෆ්‍රඩ් ගුණරත්න බවද, ඒ අනුව අන්තිම කැමති බලපත්‍රය තමන් වෙත නිකුත් කරවා ගැනීමට ඔහුට හිමිකම් ඇති බවද, මෙයින් ප්‍රකාශ කර අණකරනු ලැබේ.

ජේ. එෆ්. ඒ. සෝසා,
දිස්ත්‍රික් විනිශ්චයකාරතැන.

1972 ඔක්තෝබර් මස 18 දින.

73.01.19 විරුද්ධවාදීකම් ඉදිරිපත් කිරීම 73.04.06 දිනට දීර්ඝ කරන ලදී.

දිසා විනිසුරු තැන, මාතර.

04.06.1973 විරුද්ධවාදීකම් ඉදිරිපත් කිරීම 20.07.1973 දක්වා දීර්ඝ කරන ලදී.

දිසා විනිසුරු තැන, මාතර.

5-494—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදනා බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

1973

| මාසය | පළ කිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| මැයි | ... 73.05.04 සිකුරාද | ... 73.04.27 සිකුරාද | දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද | ... 73.05.04 සිකුරාද | දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද | ... 73.05.11 සිකුරාද | දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද | ... 73.05.18 සිකුරාද | දවල් 12.00 |
| ජූනි | 73.06.01 සිකුරාද | ... 73.05.25 සිකුරාද | දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද | ... 73.06.01 සිකුරාද | දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්ද | ... 73.06.08 සිකුරාද | දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද | ... 73.06.14 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද | ... 73.06.22 සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.